ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## පරිපාලන නිළධාරී — තනතුරු සංඛ්‍යාව : 01

සේවා ගණය : **JM 1-1**

## තනතුරෙහි ස්වභාවය

- ආයතනයෙහි පරිපාලන කටයුතු සංවිධානය කිරීම, අධීක්ෂණය හා සේවක විනය පාලනයට අදාළ සියලු කටයුතු ඉටු කිරීම.
- ආයතනයෙහි සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ කාර්යයන් අධීක්ෂණය
- ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ගේ සුබසාධක පහසුකම්, පාරිතෝෂික, දීමනා, සේවක අර්ථසාධක අරමුදල, අනෙකුත් ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳව සියලු කටයුතු අධික්ෂණය හා අංශයේ නිලධාරීන්ට උපදෙස් දීම.
- රාජකාරි කටයුතු සඳහා වාහන වෙන් කිරීම හා වාහන සඳහා ඉන්ධන සැපයීමේ කටයුතු
- අවශ්‍ය අවස්ථාවන්හී දී අංශයේ ප්‍රතිසංවිධාන කටයුතු හා නව පාලන ක්‍රම හඳුන්වාදීම හා ඊට අදාළව ඉහළ කළමනාකරණයට යෝජනා ඉදිරිපත් කිරීම.
- ආයතනයෙහි මානව සම්පත් සංවර්ධනයෙහිලා අදාළ කටයුතු ඉටු කරලීම, වැඩි දියුනු කිරීම හා ආයතනයට උචිත ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීම.
- ආයතනයෙහි ආරක්ෂක කටයුතු හා ප්‍රවාහන කටයුතු භාරව කටයුතු කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

## සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය පරිපාලනය /ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

## වයස් සීමාව

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**JM 1-1 – 2025 - රු. (72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)